Archaeological Society of Sri Lanka

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

14 වෙළුම
2 කලාපය
2018
මැයි-අගෝස්තු

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 52 වැනි වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 52 වන වාර්ෂික මහා සභා රැස්වීම 2018 අප්‍රේල් මස මස 08 වැනි දින පෙරවරුවේ කොළඹ ජාතික කෞතුකාගාරයේ ශ්‍රව්‍ය දෘශ්‍ය මැදිරියේදී පවත්වන ලදි.

ගරු සභාපති මහින්ද මලලසේකර මහතා විසින් සභාව පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය. 2017 වර්ෂයේ පැවැති 51 වන වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව සමලේකම් මුදිත කරුණාමුනි මහතා විසින් ඉදිරිපත් කරන ලදී. එය සත්‍ය වාර්තාවක් බවට යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය.

2017/2018 වර්ෂය (52 වැනි වර්ෂය) සඳහා වූ සංගමයේ ප්‍රගති වාර්තාව ඉන්පසු සභාගත කරන ලදි. එහි 2017 මාර්තු සිට 2018 මාර්තු දක්වා කාලය තුළ සංගමය මගින් සිදුකරන ලද කටයුතුවල ප්‍රගතිය, සාමාජිකයන් බඳවාගැනීම, වෙබ් අඩවිය, Google හා Facebook කණ්ඩායම් පිළිබඳ විස්තර, පළමු පර්යේෂණ සම්මන්ත්‍රණය හා විධායක සභිකයන්ගේ පැමිණීම යන තොරතුරු ඇතුළත් විය.

සංගමයේ 2017 වර්ෂය සඳහා වූ, ගණන් පරීක්ෂක විසින් අනුමත කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව සභාගත කරන ලද්දේ ගරු භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක මහතා විසිනි. එයද යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය.

### ව්‍යවස්ථා සංශෝධන යෝජනාව

සංගමයේ විධායක සභාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා සංශෝධන යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලද අතර සාකච්ඡාවකින් අනතුරුව ඒවා සම්මත වූයේ ඊට එක් කරන ලද සංශෝධනද සහිතවය. සංගමයේ සාමාජිකයන් වෙත කලින් ලිඛිතව දැනුම්දී තිබූ මෙම සංශෝධනවල අරමුණ වූයේ මූලික වශයෙන් සංගමයේ විධායක සභාවේ සංයුතිය පිළිබඳව සංශෝධන සිදුකිරීමය. (අදාළ සංශෝධන 2 වන පිටුවේ සවිස්තරව දක්වේ.)

### අධ්‍යයන චාරිකාව 01 - දකුණු පළාත

පුරාවිද්‍යා සංගමය විසින් සංවිධානය කරනු ලබන පළමු චාරිකාව සඳහා දකුණු පළාතේ පුරාවිද්‍යා කැණීම් භූමියක් අධ්‍යයනය කිරීමට යෝජනා වී තිබේ.

එම චාරිකාව ජුනි මස යාමට බලාපොරොත්තුවන අතර ඊට සහභාගී වීමට කැමති සාමාජිකයින් මැයි මස 27 වන දිනට පෙර archaeology.org.lk@gmail.com යන විද්‍යුත් ලිපිනය මගින් හෝ ගරු සම්බන්ධීකරණ ලේකම් සංජීවනී විද්‍යාරත්න මහත්මියට (071-5872591) දැනුම් දෙන ලෙස ඉල්ලමි. චාරිකාව සම්බන්ධ වැඩි විස්තර සහභාගි වීමට කැමැත්ත පළ කරනු ලබන අයට ඉදිරියේදී දැනුම්දෙමු.

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස හතර ඇතුළත පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **මැයි 13 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:

  පුරාවිද්‍යා කැණීමක් සිදු කරන්නේ කෙසේද? (දකුණු පළාතේ පුරාවිද්‍යා කැණීම් ඇසුරින්)

  දේශක: බුද්ධි නාගොඩවිතාන මහතා
  කැනීම් නිලධාරී,
  පුරාවිද්‍යා කාර්යාලය, ගාල්ල

- **ජුනි 10 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:

  ඉතිහාසකරණය හා බෞද්ධ ඥාන විභාගය

  දේශක: ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්දිම අඹන්වල මහතා
  රජරට විශ්වවිද්‍යාලය

- **ජූලි 08 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:

  ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත පුරාවිද්‍යාවේ නව සොයාගැනීම්

  දේශක: රසික මුතුකුමාරණ මහතා
  ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යා නිලධාරී,
  මුහුදු පුරාවිද්‍යා ඒකකය,
  මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාල්ල

- **අගෝස්තු 12 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:

  ගන්ධාරයේ කලාව

  දේශක: චන්දන විජේකෝන් මහතා

ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහලේ)

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 52 වැනි වාර්ෂික මහා සභා රැස්වීම..... (1 පිටුවෙන්)

### නව විධායක සභාව පත්කිරීම

ඉන්පසුව එළැඹියේ නව නිලධාරී මණ්ඩලය සඳහා ඉදිරිපත්ව ඇති යෝජනාව සම්මත කිරීමයි. විධායක සභාව විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා සාමාජිකයන් වෙත දැනුම් දී තිබූ අතර, වෙනත් නාමයෝජනා නොතිබූ බැවින්, එම යෝජනාව සාමාජිකත්වය විසින් පිළිගන්නා ලදී.

ඒ අනුව 2018/2019 වර්ෂය සඳහා පත් වූ නව නිලධාරී මණ්ඩලය මෙසේය.

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | මහින්ද පී. මලලසේකර |
| ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති | : | රංජිත් හේවගේ |
| ගරු උපසභාපති | : | ආචාර්ය කාවන් රත්නතුංග |
| ගරු ප්‍රධාන ලේකම් | : | මුදිත කරුණාමුනි |
| ගරු සම්බන්ධීකරණ ලේකම් | : | සංජීවනී විද්‍යාරත්න |
| ගරු සහකාර ලේකම් | : | යොහාන් ෆෙරෙයිරා |
| ගරු භාණ්ඩාගාරික | : | ලක්ෂ්මන් රත්නායක |
| ගරු සංස්කාරක | : | රුක්ෂිලා වෙත්තමුණි |
| ගරු විධායක සභිකවරු (11) | : | ධනේෂ් විසුම්පෙරුම |
| | | බෙනට් ප්‍රනාන්දු |
| | | බන්දු වීරවර්ධන |
| | | හේමතිලක බණ්ඩාර |
| | | සී. එච්. ඉද්දගොඩ |
| | | සිරිල් ආරියපාල |
| | | ජිමී මාරඹේ |
| | | අනුරාධ පියදාස |
| | | නාමල් ගුණසිංහ |
| | | රවී තිලකවර්ධන |
| | | චන්දන උපාලි පෙරේරා |

ඉන්පසුව ගරු සභාපති මහින්ද පී. මලලසේකර මහතා සභාව ඇමතූ අතර, ප්‍රධාන ලේකම් වන මුදිත කරුණාමුනි මහතා ස්තුති කතාව සිදුකළේය.

ඒ සමඟ ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 52 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු සමාප්ත විය.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ නව ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාව සඳහා පහත සඳහන් සංශෝධනය 2018.04.08 දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදි. මේ අනුව සංගමයේ විධායක සභාව සම්බන්ධ එම සංශෝධන එදින පටන් වලංගු වේ.**

පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාවේ 7 (අ) හා (ඇ) යන වගන්ති පහත පරිදි සංශෝධනය විය.

- 7 (අ) 4 - සම ලේකම්වරු දෙදෙනෙක් වෙනුවට ගරු ප්‍රධාන ලේකම් යනුවෙන් සංශෝධනය කිරීම.
- 7 (අ) - ගරු සහකාර ලේකම් තනතුරක් අලුතින් ඇතුළත් කිරීම.
- 7 (අ) 8 - ගරු විධායක සභිකයන් අට දෙනෙකු වෙනුවට එකොළොස් දෙනෙකු යනුවෙන් සංශෝධනය කිරීම.
- 7 (ඇ) - සමලේකම්වරු ලෙස සඳහන් සෑම ස්ථානයකම ගරු ප්‍රධාන ලේකම් ලෙස සංශෝධනය කිරීම.

ගරු ප්‍රධාන ලේකම්

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 2018-2019 වැඩ සැලැස්ම

2018.04.22 දින පැවැති විධායක සභා රැස්වීමේදි අනුමත කරන ලද 2018-2019 වර්ෂය සඳහා වු වැඩ සැලැස්ම පහත සඳහන් වෙයි.

- මාසික දේශන පැවැත්වීම
- පාර්ලිමේන්තු පනතක් මගින් සංගමය සංස්ථාපණය කිරීම
- රජයෙන් වාර්ෂික අනුග්‍රහයක් ලබා ගැනීම
- පර්යේෂණ සමුළුවක් පැවැත්වීම - 2018 වර්ෂයේ සාමාජික පර්යේෂණ සමුළුවක් පැවැත්වීම හා එයට අදාළව වැඩමුළුවක් පැවැත්වීම
- චාරිකා සංවිධානය - වාර්ෂිකව එක්දින චාරිකා 03 ක් හා දෙදින චාරිකා 01 ක් සංවිධානය කිරීම
- සංගමය මගින් ශාස්ත්‍රීය ප්‍රකාශනයක් හෝ පැරණි ප්‍රකාශනයක නව මුද්‍රණයක් ප්‍රකාශයට පත් කිරීම
- පුරාවිද්‍යා සංහිතා සඟරාව වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම
- පුරාවිද්‍යා හා ඉතිහාස ක්ෂේත්‍රයට අදාළව රටේ සිදුවන සිදුවීම් සම්බන්ධව ක්‍රියාකාරී මැදිහත් වීම
- පුරාවිද්‍යාවට සම්බන්ධ දේශීය - ජාත්‍යන්තර සබඳතා වර්ධනය
- පාසල් පෙළ පොත් වල ඉතිහාස විෂයට අදාළව නිවැරදි කිරීම් සඳහා සංගමය මැදිහත් වීම
- බ්‍රහ්මචාරී වලිසිංහ හරිස්චන්ද්‍ර අනුස්මරණ වැඩසටහන
- අභාවප්‍රාප්ත කලාභූෂණ කලාපති ධර්මසිරි කාරියවසම් ඇගයුම් වැඩසටහන
- ආචාර්ය පී.ඊ.පී. දැරණියගල සමරු වැඩසටහන

මෙම වැඩ සැලැස්ම සාර්ථක කර ගැනීම උදෙසා ඔබගේ යෝජනා හා අදහස් සංගමය ඉතා අගයකොට සලකන අතර, යෝජනා හා අදහස් නොපමාව ගරු ප්‍රධාන ලේකම් වෙත ලැබීමට සලස්වන්න.

මුදිත කරුණාමුනි
ගරු ප්‍රධාන ලේකම්
විද්‍යුත් තැපැල archaeology.org.lk@gmail.com

## පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම පිළිබඳ වැඩමුළුව - 2018 ජූලි

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකයන්ගේ පර්යේෂණ හැකියාවන් දිරිගැන්වීම් අරමුණින් ඔවුන්ගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහාම සීමා වන ශාස්ත්‍රීය පර්යේෂණ සමුළුවක් පැවැත්වීමට සංගමය අපේක්ෂා කරයි. එය මේ වර්ෂයේ අවසන් භාගයේදී පමණ පැවැත්වීමට නියමිතය.

මේ සඳහා පෙර සූදානමක් ලෙස පර්යේෂණ පිළිබඳ මූලික කරුණු ඇතුළත් වන වැඩමුළුවක් පැවැත්වීමට සංගමය අපේක්ෂා කරයි. එයට පර්යේෂණ ක්‍රමවේදය, පර්යේෂණ පත්‍රිකා රචනය, ඉදිරිපත් කිරීම, කළ යුතු හා නොකළ යුතු දේ වැනි කරුණු ගණනාවක් ඇතුළත්වනු ඇත.

සංගමයේ සාමාජිකයන් සඳහා පමණක් සීමා වන මෙම වැඩමුළුව ලබන ජූලි මසදී රාජකීය ආසියාතික සමිතියේදී පැවැත්වීමට නියමිතය. ඊට සහභාගි වීමට කැමැති සාමාජිකයින් තම නම, සාමාජික අංකය, දුරකතන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය ගරු ප්‍රධාන ලේකම් වෙත ලබාදෙන මෙන් හෝ archaeology.org.lk@gmail.com වෙත එවන මෙන් ඉල්ලා සිටිමු. (ඔබේ විද්‍යුත් තැපැල් පණිවුඩයේ Subject තීරුවේ Workshop ලෙස සඳහන්කරන්න.)

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක

ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com
වෙබ් අඩවිය -
www.archaeology.org.lk

- **ගරු සභාපති**
  මහින්ද මලලසේකර 072-3322411
- **ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති**
  රංජිත් හේවගේ 071-1712894
- **ගරු උප සභාපති**
  ආචාර්ය කාවන් රත්නතුංග 071-7072020
- **ගරු ප්‍රධාන ලේකම්**
  මුදිත කරුණාමුනි 071-2287497
- **ගරු සම්බන්ධීකරණ ලේකම්**
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- **ගරු සහකාර ලේකම්**
  යොහාන් ෆෙරෙයිරා 077-9651201
- **ගරු භාණ්ඩාගාරික**
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- **ගරු සංස්කාරක**
  රුක්ෂිලා වෙත්තමුණි 0712097055

## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- සංගමයේ ප්‍රකාශන රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google **කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද?** එසේ නම් ඔබේ නම, විද්‍යුත් ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් ගරු ප්‍රධාන ලේකම් වෙත 071-2287497 අංකයට යොමු කරන්න.

## පුරාවිදු පුවත් සංස්කරණය

**රුක්ෂිලා වෙත්තමුණි**
ගරු සංස්කාරක
rukshilawettamuni@gmail.com

# සංගමයේ නිවේදන

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 7 - 2017

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා 7 වන වෙළුම (2017) පසුගිය වාර්ෂික මහා සභා රැස්වීම දින නිකුත් කරන ලදි. ධනේෂ් විසුම්පෙරුම විසින් සංස්කරණය කරන ලද මෙහි අන්තර්ගත ලිපි හා ඒවා ලියූ ලේඛකයන් පිළිබඳ විස්තර පහත සඳහන් වෙයි.

- මැටි රූප (Terra cotta Figures) භාවිතයේ ආරම්භය හා විකාශනය
  එච්. ඩී. මේනකා නිශාන්ති
- සාහිත්‍යමය මූලාශ්‍රය තුළින් හෙළිවන පුරාතන යුගයේ ලක්දිව සංගීතය
  ඉරංගා සමින්දනි වීරක්කොඩි
- සිංහලයන්ගේ ආහාර සහ ආහාර පරිරක්ෂණය කිරීම
  ඩබ්ලිව්. රොබට් ගුණතිලක
- ඇබ්ඩන් ඉග්නේෂස් පෙරේරාඃ ප්‍රථම ලාංකික පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලිසංදේශ අධ්‍යක්ෂ
  මුදිත කරුණාමුනි
- කිලි සංකල්පය පිළිබඳ විමසුමක්
  ඊ. කේ. හේමතිලක බණ්ඩාර
- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා සඟරාවේ ලිපි නාමාවලිය
  මුදිත කරුණාමුනි
- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ කටයුතු සාරාංශය (2016-2018)

**සඟරාවේ මිල රු. 250කි. සාමාජිකයන් සඳහා විශේෂ මිල - රු. 200/= කි**

ලියාපදිංචි තැපෑලෙන් ගෙන්වාගන්නේ නම් මිල - රු. 300කි.

## අලෙවිය සඳහා ඇති ප්‍රකාශන

පහත සඳහන් ප්‍රකාශන සංගමයේ රැස්වීම් දිනවලදී ලබා ගත හැකිය.

- **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයඃ පණස් වසරක ඉතිහාසය 1966-2016 - කෘතියේ මිල රු. 350 (සාමාජිකයන් සඳහා විශේෂ මිල රු. 300කි. පිටපත් 5ක් මිලදී ගන්නා විට එකක මිල රු. 250කි)**
- **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා කලාප**
  - **වෙළුම 7 (2017) - මිල රු. 250 (සාමාජිකයන් සඳහා මිල රු. 200කි.)**
  - **වෙළුම 6 (2016) - මිල රු. 250 (සාමාජිකයන් සඳහා මිල රු. 220කි.)**
  - **වෙළුම 4 (2010) - මිල රු. 170 (සාමාජිකයන් සඳහා මිල රු. 100කි.)**

**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.

**ආපසුඃ**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.